# ලකුණු බෙදී යාමේ ආකාරය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| I **පත්‍රය** | - | 02 x 50 | = | 100 | | |
| II **පත්‍රය** | - | I **කොටස** | = | 02 x 20 | = | 40 |
| | | II **කොටස** | = | 01 x 20 | = | 20 |
| | | III **කොටස** | = | 02 x 20 | = | ___ |

| | | |
|---|---|---|
| I **පත්‍රය** | = | 100 |
| II **පත්‍රය** | = | 100 |

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .



# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.

   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..............................................................
..............................................................
.............................................................. √ $\frac{4}{5}$

(ii) ..............................................................
..............................................................
.............................................................. √ $\frac{3}{5}$

(iii) ..............................................................
..............................................................
.............................................................. √ $\frac{3}{5}$

03 (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින්

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .



ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ
I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

www.alevelapi.com

***

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .



අ.පො.ස (උ.පෙළ) විභාගය 2019 අගෝස්තු
ප්‍රශ්න පත්‍රයේ ලකුණු බෙදීයාමේ සාරාංශය

## පෙරදිග සංගීතය - I පත්‍රය

එක් පිළිතුරකට ලකුණු 02 බැගින් ප්‍රශ්න 50 ට - මුළු ලකුණු 100 යි.

## පෙරදිග සංගීතය - II පත්‍රය

### I කොටස

(01) (i) ලකුණු 04
(ii) ලකුණු 04
(iii) ලකුණු 06
(iv) ලකුණු 06

මුළු ලකුණු 20 කි.

(02) (i) ලකුණු 04
(ii) ලකුණු 04
(iii) ලකුණු (a) 03
(b) 03
(iv) ලකුණු 06

මුළු ලකුණු 20 කි.

(03) (i) ලකුණු 05
(ii) ලකුණු 04
(iii) ලකුණු 06
(iv) ලකුණු 05

www.alevelapi.com

මුළු ලකුණු 20 කි.

### II කොටස

(04) (i) ලකුණු 02
(ii) ලකුණු 04
(iii) ලකුණු 06
(iv) ලකුණු 08

මුළු ලකුණු 20 කි.

(05) (i) ලකුණු 08
(ii) ලකුණු 08
(iii) ලකුණු 04

මුළු ලකුණු 20 කි.

## III කොටස

(06) (i) ලකුණු 01

(ii) ලකුණු 02

(iii) ලකුණු 03

(iv) ලකුණු 08

(v) ලකුණු 06

මුළු ලකුණු 20 කි.

(07) (i) ලකුණු 04

(ii) ලකුණු 08

(iii) ලකුණු 08

මුළු ලකුණු 20 කි.

(08) (i) (a) ලකුණු 02

(b) ලකුණු 04 ල: 08

(c) ලකුණු 02

(ii) (a) ලකුණු 06

(b) ලකුණු 06 06x2 -ල: 12

(c) ලකුණු 06

www.alevelapi.com

මුළු ලකුණු 20 කි.

II පත්‍රය - 20x5 මුළු ලකුණු 100යි

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .



අ.පො.ස (උ.පෙළ) විභාගය - 2019 අගෝස්තු

පෙරදිග සංගීතය - I

**අභිමතාර්ථ**

01. රිෂභය හා පංචමය වාදී, සංවාදී වන රාග යුගලය තෝරයි.

02. පරමේල ප්‍රවේශක රාගය තෝරා නම් කරයි.

03. ''අලංකාරික තාන'' ආකෘතියට අනුව අන්තර්ගතය තෝරයි.

04. සම ප්‍රකෘති රාග යුගලය තෝරයි.

05. රාග ආලාප ගායනය/ වාදනය සඳහා වඩාත් ම ප්‍රයෝජනවත් අංගය තෝරයි.

06. ස්වර ප්‍රස්තාරයෙන් පිළිඹිබු වන රාගයට අදාළ ගාන සමය තෝරයි.

07. ස්වර ප්‍රස්තාරයේ ඇතුළත් තානාලංකාර වර්ගය නම් කරයි.

08. ස්වර ප්‍රස්තාරයේ ඇතුළත් කන් හා මූර්කි ස්වර විධි තෝරයි.

09. තානාලංකාර කොටසින් දැක්වෙන ශිල්ප ක්‍රමය හඳුනා ගනියි.

10. දී ඇති අවනද්ධ අක්ෂර සියල්ලම භාවිත වන තාල දෙක නම් කරයි.

11. විභාග 4 හිම එකිනෙකට වෙනස් වූ මාත්‍රා සංඛ්‍යා යෙදෙන තාලය හඳුනා ගනියි.

12. ස්වර ප්‍රස්තාරයේ දැක්වෙන වාදිතය අයත් රාගය හා තාලය නම් කරයි.

13. ''සංගීතය'' නිර්වචනය කර ඇති සංගීත ග්‍රන්ථය තෝරයි.

14. කර්ණාටක සංගීත පද්ධතියට අයත් කරුණු ඇතුළත් අක්ෂර වෙන්කර හඳුනා ගනියි.

15. අක්ෂර යටතේ දී ඇති තොරතුරුවලට අදාළ ගායන ශෛලිය නම් කරයි.

16. තත් වාද්‍ය භාණ්ඩ තුනේ ලක්ෂණ අධ්‍යයනය කර එම භාණ්ඩ පිළිවෙලින් තෝරයි.

17. තාල රූපයට අදාළ උඩරට බෙර පදය තෝරයි.

18. ගී පාද අතුරෙන් සාමූහික බව දනවන ගී පාද හඳුනා ගනියි.

19. රාග පදනම්ව නිර්මාණය වී ඇති තූර්ති ගීතය නම් කරයි.

20. ජන ජීවිතයේ තොරතුරු, ඒකාකාරී නාදමාලා ඇතුළත් පැරණිම ගීත විශේෂය හඳුනා ගනියි.

21. තනුවකට අනුව ගීතයේ මැද හෝ අග තාලානුකූලව බෙර පද ගායනා කරන ගීත විශේෂය තෝරයි.

22. කාන්තාවන් විසින් ගයනු ලබන මෙහෙ ගී විශේෂය හඳුනා ගනියි.

23. ''පස් තිතට'' අනුව ගැයෙන උඩරට නර්තන අංගය නම් කරයි.

24. නම් කර ඇති කෝලම් ගීතය ගයනු ලබන චරිතය නම් කරයි.

25. චරිත අනුව රංග ශෛලීන් අනු පිළිවෙලින් තෝරයි.

26. තාලය ගුණ කරමින් ගයනු ලබන ගායන ශෛලීන් හඳුනා ගනියි.

27. Double Reed වර්ගයේ බටහිර සංගීත භාණ්ඩ දෙක තෝරයි.

28. ඉතාලියේ නිර්මාණය වූ බටහිර සංගීත ගායන/ වාදන අංගයක් නම් කරයි.

29. බටහිර සංධ්වනි ආකෘතියට අනුව මෙරට නිෂ්පාදනය කළ සංගීත නිර්මාණ දෙකක් තෝරයි.

30. ස්වර පුවරු රූප සටහන් ඇතුළත් අපරදිග ස්වර සංචය (Chord) හඳුනාගෙන නම් කරයි.

31. දෙන ලද තොරතුරු අනුව ගායන ශෛලිය හා ගීත විශේෂය නම් කරයි.

32. දෙන ලද සංගීතඥයින් දෙදෙනා විසින් වාදනය කරනු ලබන සංගීත භාණ්ඩ නම් කරයි.

33. ජන සංගීතයට අදාළ ග්‍රන්ථ දෙකක් රචනා කළ රචකයින් නම් කරයි.

34. දෙන ලද චිත්‍රපට දෙකක සංගීත අධ්‍යක්ෂණය හා සංගීත නිර්මාණය කළ සංගීතඥයින් දෙදෙනා නම් කරයි.

35.

36. උත්තර භාරතීය රාගධාරී සංගීතයේ රාග, තාල, සංගීත භාණ්ඩ, රාග විස්තර යන ප්‍රායෝගික කොටස් භාවිතය

37. පිළිබඳව අවබෝධය පෙන්නුම් කරයි.

38.

39. දෙන ලද ස්වර අභ්‍යාසයේ තුන්වන පියවර හා අවරෝහණයේ පළමු පියවර හඳුනා ගනියි.

40. දෙන ලද ස්වර ඛණ්ඩයන්ට අදාළ වන සම ප්‍රකෘති රාග නම් කරයි.

41. කායදා හා තිහායි යන සංකල්ප හඳුනා ගනියි.

42. කවිකාර මඩුවේ සේවය කළ සංගීතඥයෙක් සහ නිර්මාණය කළ නාඩගමක් නම් කරයි.

43. සිංහල ගීතයක් කණ්ඩායම් සංගීතය සඳහා ප්‍රථම වරට යොදා ගත් සංගීත කණ්ඩායමේ නම සහ එහි

නිර්මාතෘවරයා නම් කරයි.

44. නාඩගමක චරිත දෙකක් අතර කෙරෙන සංවාදාත්මක ගී පද කොටස නම් කර ඒ සඳහා උදාහරණ තෝරයි.

45. බහුවිධ බුද්ධි න්‍යාය හඳුන්වාදුන් මනෝ විද්‍යාඥයා හා එම සිද්ධාන්තය අනුව ස්වර ස්ථාන පිළිබඳ අවබෝධය

ලැබීමට බලපාන බුද්ධිය නම් කරයි.

46. දෙන ලද ස්වර ප්‍රස්තාරයට Chords යොදා අදාළ රාගය නම් කරයි.

47. මධ්‍ය ගාන්ධාරය සහ මධ්‍ය පංචමයේ සංකේත වෙන වෙනම ලියයි.

48. සංගීත චිකිත්සාව සඳහා යොදා ගත හැකි ඉන්දියානු ශාස්ත්‍රීය සංගීතයෙහි නාද මාලා සහ දේශීය සංගීතයෙහි

එන ගීතයන්හි නාද මාලා හඳුන්වයි.

49. රේඛාව චිත්‍රපටයේ ගී තනු හා ගී පද නිර්මාපකයන් නම් කරයි.

50. පිළිගත් සංගීත පද්ධති අතුරෙන් සංගීත පද්ධති දෙකක් නම් කරයි.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .



## පෙරදිග සංගීතය (නව නිර්දේශය)

## II පත්‍රය

### අභිමතාර්ථ

### I කොටස

(01) i) සංගති අනුව රාග හඳුනාගෙන පිළිවෙලින් නම් කරයි.

ii) ඖඩව ජාති රාගයක් නම් කර රාග සංගති දෙකක් හා රාගාශ්‍රිත පල්ටාවක් ලියා දක්වයි.

iii) දෙන ලද කරුණු වලට අදාළවන රාග දෙක නම් කර, ඉන් එක රාගයකට අයත් මධ්‍යලය බ්‍යාල ගීතයක

හෝ වාදිතයක ස්ථායි කොටස ප්‍රස්තාර කර මාත්‍රා දහසයකට නොඅඩු තානාලංකාරයක් නිර්මාණය කරයි.

iv) ආසාවරී, දේස් රාගයන්ට සමප්‍රකෘති වන රාග නම් කර එම රාග අතර අසමානතා 4ක් ලියා දක්වයි.

(02) i) වගුවේ සඳහන් තොරතුරු අනුව සංගීත භාණ්ඩ හතර හඳුනාගෙන නම් කරයි.

ii) එම එක් සංගීත භාණ්ඩයක් පිළිබඳව දෙන ලද කරුණු වලට අදාළව කෙටි විස්තරයක් ලියයි.

iii) (a) මිශ්‍ර රාගයට අයත් වන ස්වර ප්‍රස්තාරයේ පූර්වාංගයෙන් හා උත්තරාංගයෙන් පිළිඹිබු වන නිර්දේශිත රාග

හඳුනා ගනිමින් එම මුබඩාව අයත් ස්වර කොටස හඳුනාගෙන ලියයි.

(b) දෙන ලද ස්වර ප්‍රස්තාරයේ සංකේත වලින් පැහැදිලි වන ස්වර උත්පාදන විධි තුනක් උදාහරණ සහිතව නම් කරයි.

iv) ඒක් තාලය නියමිත තාල සංකේත සහිතව ප්‍රස්තාර කර iii හි සඳහන් ස්වර රචනාව පිළිවෙල වෙනස් නොවන අයුරින් ඒක් තාලය අනුව ප්‍රස්තාර කරයි.

(03) i) නිර්දේශිත සමප්‍රකෘති රාග සංගතීන් අනුව, රාග සහ රාග ජාති හඳුනාගෙන ලියයි.

ii) භෛරව සහ ආසාවරී යන රාග දෙකෙන් කැමති රාගයක මධ්‍යලය බ්‍යාල් ගීතයක හෝ වාදිතයක අන්තරා

කොටස ස්වර ප්‍රස්තාර කර දක්වයි.

iii) දීප්චන්දි තාලයේ ඨේකාව නියමිත තාල සංකේත සහිතව ප්‍රස්තාර කර, තෝරා ගත් රාගයට අදාළව තිහායි

සහිත තානාලංකාරයක් ප්‍රස්තාර කරයි.

iv) දෙන ලද කරුණු යටතේ උත්තර භාරතීය හා දක්ෂිණ භාරතීය පද්ධති දෙකෙහි අසමානතා ලියා දක්වයි.

## II කොටස

(04) i) දෙන ලද වගුවේ ඇතුළත් තොරතුරු හා සම්බන්ධ ජන ගී විශේෂ නම් කරයි.

ii) උඩරට වන්නම් ගායනයේ ලක්ෂණ හතරක් ලියයි.

iii) බඹර කැපීමේ ගීතයන් හි සාරධර්ම හා සෞන්දර්යාත්මක අගයන් ඉස්මතු වන ආකාරය පද්‍ය පාද උදාහරණයට ගනිමින් පැහැදිලි කරයි.

iv) සුළු මහ දෙතිතට ගැයෙන නිර්දේශිත වන්නමක තාල රූපයේ විශේෂත්වය පැහැදිලි කරමින්, තානම හා කවිය පද ප්‍රස්තාර කරයි.

(05) i) නූර්ති රංග ශෛලියට ලද හින්දුස්ථානි සංගීතයේ ආභාසය පිළිබඳ විමසයි.

ii) නාඩගම් රංග ශෛලියට ලද කර්ණාටක සංගීතයේ ආභාසය පිළිබඳ විමසයි.

iii) කෝලම් සහ සොකරි සම්ප්‍රදායන් හි රංග ලක්ෂණ හා සංගීත ලක්ෂණ සසඳයි.

## III කොටස

(06) i) (a) දෙන ලද අපරදිග ස්වර ප්‍රස්තාරයට අයත් ස්කේලය හඳුනා ගනියි.

(b) එම ස්කේලයට අයත් ස්වර පිළිවෙලින් ලියයි.

ii) ටයිම් සිග්නේචරයට ගැලපෙන හින්දුස්ථානි තාලය හඳුනාගෙන ඨේකාව ප්‍රස්තාර කරයි.

iii) දෙන ලද අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග සංගීත ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරයි.

iv) බටහිර සංගීතමය ප්‍රායෝගික කරුණු දෙකක් නිදසුන් දක්වමින් විස්තර කරයි.

(07) i) ගී පාදයක් ගැලපෙන තාලය අනුව පද බෙදා ප්‍රස්තාර කරයි.

ii) ගී පද ප්‍රස්තාරයට සුදුසු තනුවක් (නිර්දේශිත රාගයක් ඇසුරින්) නිර්මාණය කර ගීත ස්වර ප්‍රස්තාර කරයි.

iii) ස්වර රචනාවන්ට ගැලපෙන ලෙස කෝඩ්ස් හඳුනා ගනී.

www.alevelapi.com

(08) i) (a) අපරදිග සංගීත හඬ තල නම් කරයි.

(b) හඬතල හතරට අදාළ වන සංගීත භාණ්ඩ හඳුනාගෙන පෙලගස්වයි.

(c) ''ජොහාන් සෙබස්තියන් බාක් '' සංගීතඥයාගේ සංගීත නිර්මාණ දෙකක් නම් කරයි.

ii) (a) සංගීතයේ දී කණ හා ස්වරාලය වැදගත් වන අයුරු පහදයි.

(b) මුල් යුගයේ දේශීය චිත්‍රපට සඳහා ලද දකුණු ඉන්දීය ආභාසය විමර්ශනය කරයි.

(c) මනස සුවපත් කිරීමේ ලා සංගීත චිකිත්සාවේ වටිනාකම අගයයි.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.07/ 0830 - 1030

පෙරදිග සංගීතය I
கீழைத்தேய சங்கீதம் I
Oriental Music I

54 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : ..........................

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 01 | 1 - 4 | |
| 02 | 5 - 12 | |
| 03 | 13 - 20 | |
| 04 | 21 - 30 | |
| 05 | 31 - 42 | |
| 06 | 43 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**උපදෙස්:**
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.

● අංක **1** සිට **30** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ ඉතා ම ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ** ලියන්න.

**1.** 'රිෂභය' වාදී ස්වරය ලෙසත්, 'පංචමය' සංවාදී ස්වරය ලෙසත් යෙදෙන රාග යුගලය තෝරන්න.
(1) දේස් - හංසධ්වනි (2) හංසධ්වනි - තිලක්කාමෝද්
(3) තිලක්කාමෝද් - ආසාවරී (4) ආසාවරී - ජයජයවන්ති
(5) ජයජයවන්ති - දේස් (..05..)

**2.** 'පරමේල ප්‍රවේශක' රාග යටතට ගැනෙනුයේ,
(1) දේස් රාගයයි. (2) හංසධ්වනි රාගයයි.
(3) ජයජයවන්ති රාගයයි. (4) කාලිංගඩා රාගයයි.
(5) ජෞනපුරී රාගයයි. (..03..)

**3.** 'අලංකාරික තාන' නිර්මාණයේ දී වඩාත් ප්‍රයෝජනවත් වනුයේ,
(1) රාග සංගතීන් ය. (2) රාග විස්තර ය.
(3) රාගාශ්‍රිත පල්ටා ය. (4) රාග මුඛ්‍යාංග ය.
(5) රාග ආරෝහණ-අවරෝහණ ය. (..03..)

**4.** සමප්‍රකෘති රාග යුගලයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) දේස් - බිහාග් (2) බිහාග් - හංසධ්වනි
(3) හංසධ්වනි - තිලක්කාමෝද් (4) තිලක්කාමෝද් - කාලිංගඩා
(5) කාලිංගඩා - භෛරව (..05..)

**5.** රාග ආලාප ගායනය/වාදනය සඳහා වඩාත් ම ප්‍රයෝජනවත් වනුයේ,
(1) රාග සංගතීන් ය. (2) රාග පල්ටා ය. (3) රාග ගීතය ය.
(4) රාග ලක්ෂණ ය. (5) රාග ගානසමය ය. (..01..)

● අංක **6** සිට **8** තෙක් ප්‍රශ්න සඳහා, තානාලංකාර සහිත වාදිතයකට අයත් පහත ස්වර ප්‍රස්තාරය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| | | ග ම රි ස | – ස ග ම |
| නි | | | |
| ධ – – ධ | ප – (ම) – | නිස ගම පධ නිස් | නිධ පම ගරි ස– |
| X | 2 | 0 | 3 |

**6.** ඉහත ප්‍රස්තාරයෙන් පිළිබිඹු වන රාගය සහ අදාළ 'ගානසමය' කුමක් ද?
(1) භෛරව - රාත්‍රි ප්‍රථම ප්‍රහරය
(2) කාලිංගඩා - රාත්‍රි ප්‍රථම ප්‍රහරය
(3) භෛරව - සන්ධ්‍යා සන්ධි ප්‍රකාශ සමය
(4) කාලිංගඩා - දිවා ප්‍රථම ප්‍රහරය
(5) භෛරව - උදය සන්ධි ප්‍රකාශ සමය (..05..)

**7.** ස්වර ප්‍රස්තාරයෙහි සඳහන් 'තානාලංකාර' වර්ගය කුමක් ද?
(1) අලංකාරික තාන (2) බෝල් තාන (3) සපට් තාන
(4) මිශ්‍ර තාන (5) කූට තාන (..03..)

**8.** ඉහත ස්වර ප්‍රස්තාරයෙහි සඳහන් 'කන්' ස්වරය සහ 'මූර්කි' ස්වරය පිළිවෙළින්,
(1) ධ සහ ම වේ. (2) නි සහ රි වේ. (3) ම සහ නි වේ.
(4) නි සහ ම වේ. (5) ම සහ රි වේ. (..04..)

**9.**

| | | | |
|---|---|---|---|
| ගම රිස ගම ධ,ග | මරි සග මධ, ගම | රිස ගම ධ-, ගම | රිස ගම ධ,ග මරි |
| සග මධ, ගම රිස | ගම ධ-, ගම රිස | ගම ධ,ග මරි සග | මධ, ගම රිස ගම |
| ධ | | | |
| x | 2 | 0 | 3 |

ඉහත තානාලංකාර කොටසින් පිළිබිඹු වන්නේ,
(1) මුඛඩාවක් ය. (2) තිහායි එකක් ය.
(3) ගමක් ය. (4) උපජ් ය.
(5) චක්‍රදාර් එකක් ය. (..05..)

**10.** තබ්ලාවෙන් වැයෙන ධා, ධිං, තිං, තා යන අවනද්ධාක්ෂර සියල්ල ම යොදා ගැනෙන නිර්දේශිත තාල දෙකක් වන්නේ,
(1) ත්‍රිතාල් සහ දාදරා ය. (2) දාදරා සහ දීප්චන්දි ය.
(3) දීප්චන්දි සහ ත්‍රිතාල් ය. (4) ත්‍රිතාල් සහ ජප්තාල් ය.
(5) ජප්තාල් සහ දාදරා ය. (..03..)

**11.** විභාගවල මාත්‍රා සංඛ්‍යා එකිනෙකට වෙනස්ව යෙදෙන, විභාග හතරකින් යුත් තාලය තෝරන්න.
(1) ජප් තාලය (2) දීප්චන්දි තාලය
(3) තිලවඩා තාලය (4) ත්‍රිතාලය
(5) ධමාර් තාලය (..05..)

**12.**

| | | | | | |
|---|---|---|---|---|---|
| ස් – | නි ධ | ම පධ | ග – | ම ග | රි ස |
| x | 0 | 2 | 0 | 3 | 4 |

ඉහත ස්වර ප්‍රස්තාරයෙන් පිළිබිඹු වන ගත් වාදිතයෙහි රාගය සහ තාලය වන්නේ පිළිවෙළින්,
(1) බාගේශ්‍රී සහ චෞතාල් ය. (2) ආසාවරි සහ චෞතාල් ය.
(3) දේස් සහ ඒක්තාල් ය. (4) බාගේශ්‍රී සහ ඒක්තාල් ය.
(5) ජයජයවන්ති සහ ඒක්තාල් ය. (..04..)

**13.** සංගීතය යනු "ගීතං වාද්‍යං තථා නෘත්‍යං-ත්‍රයං සංගීතමුච්‍යතේ" ලෙස නිර්වචනය කරනු ලැබුවේ,
(1) සංගීත රත්නාකර කෘතියෙහි ය. (2) සංගීත පරිජාත කෘතියෙහි ය.
(3) බෘහත්දේශී කෘතියෙහි ය. (4) නාට්‍ය ශාස්ත්‍ර කෘතියෙහි ය.
(5) ක්‍රමික් පුස්තක් මාලිකා කෘතියෙහි ය. (01)

● පහත කරුණු ඇසුරෙන් **14** සහ **15** යන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
A - මෘදංගම්
B - පඛාවාජ්
C - පල්ලවි - අනුපල්ලවි
D - ස්ථායි - අන්තරා
E - ආදි තාලම්
F - චෞතාල්

**14.** කර්ණාටක සංගීත පද්ධතියට අයත් කරුණු ඇතුළත් වන්නේ කුමන අක්ෂර යටතේ ද?
(1) A, B හා C (2) A, C හා E (3) B, C හා D
(4) B, D හා F (5) C, D හා E (02)

**15.** B සහ F යන අක්ෂර යටතේ සඳහන් කරුණු හා සම්බන්ධ ගායන ශෛලිය කුමක් ද?
(1) ධමාර් (2) ඛ්‍යාල් (3) ධ්‍රැපද් (4) චතුරංග (5) වර්ණම් (03)

**16.** තත්වාද්‍ය භාණ්ඩ තුනකට අයත් ලක්ෂණ පහත දැක්වේ.
A - පර්දා සහිත ය - අළුවෙන් වැයේ
B - පර්දා රහිත ය - අළුවෙන් වැයේ
C - පර්දා සහිත ය - අළුවෙන් නොවැයේ
A, B, C සඳහා ගැළපෙන සංගීත භාණ්ඩ පිළිවෙළින් සඳහන් වරණය කුමක් ද?
(1) සිතාර්, සාරංගි, එස්රාජ් (2) සිතාර්, වයලින්, එස්රාජ්
(3) එස්රාජ්, වයලින්, සරෝද් (4) එස්රාජ්, සාරංගි, සරෝද්
(5) එස්රාජ්, වයලින්, සිතාර් (05)

**17.** | $\hat{1}$ 2 | $\acute{1}$ 2 3 4 | $\hat{1}$ 2 | $\acute{1}$ 2 3 4 | යන තාලරූපයට වාදනය කළ හැකි උඩරට බෙරපදය කුමක් ද?
(1) ජිං | කිටිතත් | තත් | කිටිතක (2) දොං | දිංගත | ගත් | දිත්තක
(3) දොං | දොංජිං | ජිං | ගජිගත (4) ගුං | දදෙගත | ගදි | ගතගුද
(5) ජිං | තකුකුද | ගදි | තකුකුද (03)

**18.** පහත දැක්වෙන ගී පාද අතුරෙන්, ගැමි සමාජයේ 'සාමූහික බව' දනවන අවස්ථා විදහා දැක්වෙන ගී පාද තෝරන්න.
A - තෙල් ගාලා හිස පීරන් නෑනෝ
B - වෙල් යායක ගොන් දෙන්නෙක් කකා උනි
C - වරම් ගොයම් කැපුමට දෙවියන්ගෙ වරම්
D - අම්මපල්ලා බඹරුන් අත වරද නැති
E - සූරිය උදාවන තුරු පිනි බෑවිල්ල
(1) A සහ C (2) A සහ E (3) B සහ C
(4) B සහ D (5) D සහ E (01)

**19.** හින්දුස්ථානි රාගධාරි සංගීතයේ එන ජෞනපුරි සහ භෛරවි යන රාග පදනම්ව නිර්මාණය වූ නර්ති ගීත දෙකක් වන්නේ පිළිවෙළින්,
(1) 'ලෝනා මුණි රාජාගේ' සහ 'අප ගුණසරු සිංහල' යන ගීතයි.
(2) 'සිරි සංඝබෝධි' සහ 'සෝබමාන දේ වපුරා' යන ගීතයි.
(3) 'මිහිරි නාද කෝකිලාදි' සහ 'සවන්දී පෙර රාම' යන ගීතයි.
(4) 'පායන මේ බැද්දෙ' සහ 'බන්දා මා දේදෙ' යන ගීතයි.
(5) 'දන්න වංහුං අප' සහ 'දන්නෝ බුදුන්ගේ' යන ගීතයි. (01)

**20.** ජන ජීවිතයේ සිදුවීම් ඇතුළත්, ආවේණික භාෂාවෙන් හා ඒකාකාරී නාදමාලාවන්ගෙන් සමන්විත වූ පැරණිතම ගීත විශේෂය කුමක් ද?
(1) ටීකා සීපද (2) සැහැලි (3) සිව්දම් (4) වැදි ගීත (5) යාදිනි (04)

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .



**21.** 'ගීතයක් මධ්‍යයේ හෝ අග හෝ තනුවකට අනුව තාලානුකූලව බෙරපද ගායනා කරන ගීත විශේෂය කුමක් ද?
(1) හටන් (2) මංගලම් (3) අස්නෙ (4) වන්නම් (5) ප්‍රශස්ති (..05..)

**22.** දීර්ඝ යති යෙදෙන අඩු ලයකින් යුතුව, කාන්තාවන් විසින් ගයනු ලබන මෙහෙ ගී විශේෂය කුමක් ද?
(1) වරම් ගී (2) ගොයම් ගී (3) නෙළුම් ගී (4) කමත් ගී (5) ඇල් ගී (..03..)

**23.** තුන්සුළු දෙමහ පස්තිතට අනුව ගැයෙන උඩරට නර්තන අංගයක් වන්නේ,
(1) අස්නෙ ය. (2) මංගලම් ය.
(3) කොහොඹා හැල්ල ය (4) වට්ටම් ය.
(5) වන්නම් ය. (..02..)

**24.** "බාල මෙ මගෙ වැරදි නොගන් - මෙම රාළහාමිලා මට ආයුබොවන්" යන ගීතය ගයනු ලබන කෝලම් චරිතය කුමක් ද?
(1) සඳ කිඳුරිය (2) ජසයා
(3) නොංචි අක්කා (4) ලෙන්චිනා
(5) මුදලි (..04..)

**25.** පොතේ ගුරු, සබේ විදානේ, සූත්‍රධාරී යනාදී චරිත ඇතුළත් රංග ශෛලීන් අනුපිළිවෙළින් පෙළගැසී ඇති වරණය කුමක් ද?
(1) කෝලම්, නාඩගම්, නූර්ති (2) නූර්ති, කෝලම්, නාඩගම්
(3) නාඩගම්, නූර්ති, කෝලම් (4) නූර්ති, නාඩගම්, කෝලම්
(5) නාඩගම්, කෝලම්, නූර්ති (..05..)


**26.** දෙගුණ, තෙගුණ, සිවුගුණ වශයෙන් ගුණ කරමින් (ලයකාරී) ගයනු ලබන ගායන ශෛලීන් දෙකක් අඩංගු වරණය කුමක් ද?
(1) චතුරංග සහ ධමාර් (2) ධ්‍රැපද් සහ ඛ්‍යාල්
(3) ධ්‍රැපද් සහ චතුරංග (4) ධ්‍රැපද් සහ ධමාර්
(5) ගසල් සහ ධමාර් (..04..)

**27.** Wood wind Instruments යටතේ Double Reed වර්ගයේ භාණ්ඩ දෙකක් සඳහන් වන වරණය තෝරන්න.
(1) Piccolo, Bassoon (2) Obeo, Bassoon
(3) Bassoon, Flute (4) Clarinet, Oboe
(5) Saxophone, Piccolo (..02..)

**28.** ඉතාලියෙහි සම්භවය ලද සමූහ වාදන මෙන්ම සමූහ ගායනා ද ඇතුළත් බටහිර සංගීත අංගය කුමක් ද?
(1) සංධ්වනි (2) ඔපෙරා (3) බැලේ (4) කැන්ටාටා (5) සොනාටා (..04..)

**29.** බටහිර සංධ්වනි ආකෘතිය අනුගමනය කරමින් මෙරට ගොඩනැගුණ සංගීත නිර්මාණ දෙකක් සඳහන් වරණය කුමක් ද?
(1) මානසවිල සහ පිරිනිවන් මංගල්‍යය (2) පන්සිළු සහ වැස්ස
(3) මාර පරාජය සහ අග්නි (4) පේමතෝ ජායතී සෝකෝ සහ මගේ කාලයේ මවුනි
(5) ගොයම්දා මඟුල සහ පහනින් පහන (..02..)

**30.**




ඉහත ස්වර පුවරු රූපසටහනේ ලකුණු කර ඇති ස්වර **ත්‍රිත්වය** එකවර වැයෙන විට නිකුත් වන අපරදිග ස්වර සංචය (CHORD) නම් කරනුයේ,
(1) C Major යනුවෙනි. (2) C Augmented යනුවෙනි.
(3) C Diminished යනුවෙනි. (4) C Sharp Major යනුවෙනි.
(5) C Minor යනුවෙනි. (..02..)

- අංක **31** සිට **50** තෙක් ප්‍රශ්නවල ඇති හිස්තැන් සඳහා සුදුසු ම පිළිතුරු යොදන්න.

**31.** 'පන්කජ් උදාස්' නම් භාරතීය ගායන ශිල්පියා ........ගසල්........ ගායන ශෛලියට සුප්‍රසිද්ධ වේ. 'පායෝජි මෛනේ රාම රතන' ගීතය ........භජන්........ ගායන ශෛලියට අයත් ය.

**32.** උස්තාද් බිස්මිල්ලා ඛාන් ......ෂෙනායි........ නමැති සංගීත භාණ්ඩය වාදනය සඳහා සුප්‍රසිද්ධ වන අතර, පණ්ඩිත් ශිවකුමාර් ශර්මා ........සන්තූර්........ නමැති සංගීත භාණ්ඩය වාදනය සඳහා සුප්‍රසිද්ධ වේ.

**33.** වර්ෂ 1962 දී පළවූ 'හෙළ ගී මග' කෘතිය .....ඩබ්.බී.. මකුලොලුව..... මහතා විසින් ද එම වසරේදී ම පළ වූ 'බ්‍යාල ගීත' කෘතිය ........ආනන්ද ජයසිංහ........ මහතා විසින් ද රචනා කරන ලදී.

**34.** 'බඹරු ඇවිත්' චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂණය ........ප්‍රේමසිරි කේමදාස........ සූරීන් විසින් සිදු කරන ලද අතර, සංගීත් නිපුන් පී. වී. නන්දසිරි සූරීන් ගැයූ 'කමලාසිනී' ගීතයේ සංගීත නිර්මාණය........ෂෙල්ටන් ප්‍රේමරත්න........ සූරීන් විසින් සිදු කරන ලදී.

- අංක **35** සිට **38** තෙක් ප්‍රශ්න සඳහා පහත ඡේදය කියවා පිළිතුරු සපයන්න.

සංගීත ප්‍රසංගයක දී නිපුනි විසින් අළුවෙන් (Bow) වැයෙන, පර්දා නොමැති, සිය සංගීත භාණ්ඩයේ අනුතත් සුසර කර ගනිමින්, අ. පො. ස. (උසස් පෙළ) සඳහා නිර්දේශිත රාගයකින් ඉදිරිපත් කරන ලද වාදිතයේ, අන්තරා කොටස, | මපනි | සං-සංසං | රිං රිංගං රිං | සං - නිධ | ලෙස, එක් තතක් මත ඇඟිලිවල නියපොතු ඝර්ෂණය කරමින් වැයී ය.

**35.** නිපුනි විසින් වැයූ රාගය අයත් මේලය ........බමාජ්........ නමින් හැඳින්වෙන අතර, එම රාගයේ ජාතිය ........සම්පූර්ණ........ වේ.

**36.** ඉහත වාදිතයේ කෝමල ගාන්ධාරය විවාදි වූයේ නම්, ඇය වැයූවේ ........දේස්........ රාගය වන අතර කෝමල ගාන්ධාරය ආංගිකව යෙදුවේ නම්, ඇය වැයූවේ ........ජයජයවන්ති........ රාගයයි.

**37.** 'නිපුනි' වැයූ භාණ්ඩය ........සාරාංගිය........ නමින් හැඳින්වෙන අතර ඉහත ඡේදයෙහි විස්තරය අනුව අළුව වෙනුවට වෙනත් උපකරණයක් යොදා ගත්තේ නම් ඇය වැයූ භාණ්ඩය ........සරෝද්........ ලෙස නම් කළ හැකි ය.

**38.** එම වාදිතය සඳහා වැයූ තාලය ........දිප්චන්දි........ නමින් හැඳින්වෙන අතර, එම තාලය වැයූ වාද්‍ය භාණ්ඩය ........තබ්ලා........ නමින් හැඳින් වේ.

**39.** ග ස රි ම, ම රි ග ප, වශයෙන් ආරෝහණයට පිළිවෙළින් යෙදෙන ස්වර අභ්‍යාස රටාවේ ඊළඟ පියවරට අයත් ස්වර හතර ....පගමධ.... වන අතර, එහි අවරෝහණ රූපයට අනුව යෙදෙන ප්‍රථම පියවරෙහි ස්වර හතර ....ධසනිප.... වේ.

**40.** පහත දැක්වෙන එක් එක් ස්වර ඛණ්ඩය අයත් වන නිර්දේශිත සමප්‍රකෘති රාග නම් කරන්න.

(a) මපධුසං, නිධුප ........ආසාවරී........

(b) පධුනිසං, නිධුප ........ජෞනපුරි........

**41.** ධාධාතිට | ධාධාතුනා | තාතාතිට | ධාධාතුනා | වශයෙන් වැයෙන කායදාව අයත් වන තාලය........ත්‍රිතාල්........ නමින් හැඳින්වෙන අතර ධාධාතිට ධාධාතුනා | ධා +, වශයෙන් වූ අවනද්ධාක්ෂර තෙවරක් වාදනය කිරීම ........තිහායි........ නමින් හැඳින්වේ.

**42.** කවිකාර මඩුවෙහි සේවය කළ කර්ණාටක සංගීතඥයින් වන අලගනායිදු, නාරසිංහ සහ ........ගණිතාලංකාර........ යන තිදෙනා අතුරෙන් අලගනායිදු විසින් ........හරිශ්චන්ද්‍ර........ නම් වූ නාඩගම නිර්මාණය කරන ලද බව සඳහන් වේ.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .



**43.** සිංහල ගීතයක් කණ්ඩායම් සංගීතය සඳහා ප්‍රථම වරට යොදාගත් සංගීත කණ්ඩායමේ නම ........ **ලොස්කැබලෙරෝස්** ........ වන අතර එම කණ්ඩායමේ නායකයා ........ **නෙවිල් ප්‍රනාන්දු** ........ නම් වේ.

**44.** නාඩගමක චරිත දෙකක් අතර යෙදෙන සංවාදාත්මක ගී පද කොටස ........ **තර්ගය** ........ නමින් හැඳින්වේ. ඒ සඳහා උදාහරණයක් ලෙස ........ **ඉව්ජින්** ........ නාඩගමෙහි ගැයෙන 'යානත අතුල මල්පෙති' ගීතය සඳහන් කළ හැකි ය.

**45.** ඇමෙරිකානු ජාතික ........ **හොවාර්ඩ් ගාඩ්නර්** ........ නම් මනෝවිද්‍යාඥයා විසින් හඳුන්වා දුන් 'බහුවිධ බුද්ධිය' සිද්ධාන්තය අනුව ස්වර ස්ථාන පිළිබඳ අවබෝධය ඇති වීමට ........ **සංගීතමය හෝ සංගීත රිද්මයානුකූල** ........ බුද්ධිය හේතු වේ.

**46.** | ග - ප | රි - නි | ප නි රි | ග - - | ස්වර ප්‍රස්තාරයට අදාළ කෝඩ්ස් (Chords) පිළිවෙළින් විභාග හතර මත යෙදෙනුයේ ........ **CGGC** ........ ලෙස වන අතර, ඉන් පිළිබිඹු වන නිර්දේශිත රාගය ........ **හංසධ්වනි** ........ නම් වේ.

**47.** 'මධ්‍ය සඩ්ජ' ස්වරයේ සංඛ්‍යාතය හර්ට්ස් 256ක් වන්නේ නම්, ඊට අදාළව 'මධ්‍ය ගාන්ධාරයේ' සංඛ්‍යාතය හර්ට්ස් ........ **320** ........ ලෙස ද 'මධ්‍ය පංචමයේ' සංඛ්‍යාතය හර්ට්ස් ........ **384** ........ ලෙස ද වේ.

**48.** සංගීත චිකිත්සාව සඳහා ඉන්දියානු ශාස්ත්‍රීය සංගීතයෙහි ........ **රාග** ........ හා බැඳි නාදමාලාවන්ද, මෙරට දේශීය සංගීතයෙහි නැලවිලි ගීත සහ ........ **ශාන්තිකර්ම** ........ ගීතයන්හි එන නාදමාලාවන් ද යොදාගෙන ඇත.

**49.** දේශීය චිත්‍රපට කලාවේ සන්ධිස්ථානයක් වන රේඛාව චිත්‍රපටයේ ස්වතන්ත්‍ර තනු නිර්මාණය ........ **සුනිල් සාන්ත** ........ විසින් ද ගීත ප්‍රබන්ධය ........ **මර්සලීන් ජයකොඩි** ........ විසින් ද සිදු කරන ලදී.

**50.** පිළිගත් සංගීත පද්ධති ලෙස සලකනු ලබනුයේ පෙරදිග, අපරදිග, ........ **චීන** ........, ඉස්ලාමික් සහ ........ **ගම්ලෑන් (ගම්ලාන්)** ........ නම් වූ සංගීත පද්ධතීන් ය.

**(ගම්ලෑන් හෝ චීන වශයෙන් පිළිතුරු මාරු වී ඉදිරිපත් කළ හැකිය)**

* * *

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .



## I කොටස

**1.** පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග හතරකට අයත් ස්වර සංගති කිහිපයකි.

A - ස, රිග මපනිසං නිධප

B - ස, රිග ගපනිසං නිනිප

C - ස, රිම මපධසං නිධප

D - ස, රිම මපනිසං නිධප

(i) ඉහත රාග හතර හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) ඉහත රාග අතුරෙන් ඖඩව ජාති රාගය නම් කර එම රාගයට අදාළ ව ඉහත සඳහන් **නොවන** ආකාරයේ රාග සංගති **දෙකක්** ලියා, රාගාශ්‍රිත පල්ටාවක් ද (ස්වර අභ්‍යාස) ලියන්න. (ලකුණු 04 යි.)

(iii) ඉහත රාග අතුරෙන් වාදි-සංවාදි, ගානසමය, ජාතිය සහ ඡේලය යන කරුණු සියල්ල සමාන ලෙස යෙදෙන රාග **දෙක** නම් කර, එම **එක්** රාගයකට අදාළ මධ්‍යලය ඛ්‍යාල් ගීතයක හෝ වාදිතයක හෝ ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කර, ඊට අදාළ මාත්‍රා 16 කට නොඅඩු තානාලංකාරයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි.)

(iv) ඉහත C හා D හි සඳහන් ස්වර සංගතීන්ට අයත් රාග දෙකට සමප්‍රකෘති වන රාග **දෙක** අදාළ ඉංග්‍රීසි අක්ෂර ද සමග නම් කර, එම **එක්** සමප්‍රකෘති රාග යුගලයක **අසමානතා හතරක්** ලියන්න. (ලකුණු 06 යි.)

i

- A B C D යන රාග හතර පිළිවෙලින් නම් කිරීම - (ල. 01x4) **- ලකුණු 04**

ii

- ඖඩව ජාති රාගය නම් කිරීම - ල. 01
- රාග සංගති දෙක ලිවීමට - ල. 01

  (ප්‍රශ්න පත්‍රයෙහි සඳහන් නොවන සංගති ලිවිය යුතුය)
- රාගාශ්‍රිත ස්වර පල්ටාව (ස්වර අභ්‍යාසය ලිවීමට) - ල. 02

  (පල්ටාව උච්ච සඩ්ජය දක්වා පිළිවෙලින් වර්ධනය විය යුතුය)

**- ලකුණු 04**

iii

- රාග විස්තරවලට සමාන වන රාග දෙක නම් කිරීමට - ල. 01

  (එක රාගයකට ලකුණු 001/2 බැගින් හිමිවේ.)
- එක් රාගයකට අදාළ මධ්‍යලය ඛ්‍යාල් ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස ලිවීමට -ල. 04

  (ස්වර ප්‍රස්තාරයට පාද දෙකක් ප්‍රමාණවත් වේ.)
  (එක විභාගයකට ලකුණු 001/2 බැගින් හිමිවේ.)
- මාත්‍රා 16 කට නොඅඩු තානාලංකාරය ලිවීමට - ල. 01

**ලකුණු 06**

iv

- C හා D අක්ෂරයන්ට අදාළ රාගයන්හි සමප්‍රකෘති රාග නම් කිරීමට - ල. 02
- සමප්‍රකෘති රාග යුගලයේ අසමානතා හතරක් ලිවීමට - ල. 04

**ලකුණු 06**

**මුළු ලකුණු 20 යි.**

i A - ජයජයවන්ති රාගය

B - හංසධ්වනි රාගය

C - ආසාවරී රාගය

D - දේස් රාගය

ii හංසධ්වනි රාගය - රාග සංගති

| | |
|---|---|
| සරිගපරි | පනිසගරි |
| ගරිසනිප | ගපසනිප |
| පනිරිග | සනිපගරි |
| ගරිනිපස | නිපරිනිස |

පල්ටා

- ගගරිස

  පපගප, ගගරිස

  පපගප, නිපගප ගගරිස

  පපගප නිස, නිපගප ගගරිස

- ගප ගගරිස

  ගපනිප ගප ගගරිස

  ගපනිස නිපගප ගගරිස

  ගපනිස රිසනිස නිපගප ගගරිස

  ගපනිස රිගරිස නිස නිපගප ගගරිස

- ගරිසරි ගප

  ගරිසරි ගප නිපගප

  ගරිසරි ගපනිස නිපගප

  ගරිසරි ගපනිස රිසනිස නිපගප

  ගරිසරි ගපනිස ගරිසරි සස නිපගප ගරිස

iii ජයජයවන්ති රාගය හා දේස් රාගය

- ඉහත රාග දෙකෙන් එක් රාගයකට අදාළව මධ්‍යලය ඛ්‍යාල් ගීතයක හෝ වාදිතයක හෝ ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කර තිබිය යුතුය.
- එම ස්වර ප්‍රස්තාරයට අදාළව මාත්‍රා 16 කට නොඅඩු තානාලංකාරයක් ප්‍රස්තාර කර තිබිය යුතුයි.

iv C - ජෞනපුරි රාගය

D - තිලක්කාමෝද් රාගය

ආසාවරී - ජෞනපුරි හෝ දේස් - තිලක්කාමෝද්

ආසාවරී රාගයේ හා ජෞනපුරි රාගයේ අසමානතා

- ආසාවරී රාගයේ ආරෝහණයේ ස්වර ස රි ම ප ධ ස වන අතර ජෞනපුරි රාගයේ ආරෝහණයේ ස්වර ස රි ම ප ධ නි ස ලෙස යෙදේ.

  (ඉහත අදහස මතුවන ඕනෑම ආකාරයේ පිළිතුරක් පිළිගත යුතුවේ.)
- ආසාවරී රාගය ඖඩව සම්පූර්ණ වන අතර ජෞනපුරි රාගය ෂාඩව සම්පූර්ණ වේ.
- ආසාවරී රාගයේ ආරෝහණයේ ගාන්ධාරය හා නිශාදය වර්ජිත වන අතර ජෞනපුරි රාගයේ ගාන්ධාරය පමණක් වර්ජිත වේ. ( ආසාවරී රාගයේ ආරෝහණයේ නිෂාදය වර්ජ්‍ය වන අතර ජෞනපුරි රාගයේ ආරෝහණයේ නිෂාදය යෙදේ.)
- ආසාවරී රාගයේ මුඛ්‍යාංගය රිමප, නිධප වන අතර ජෞනපුරි රාගයේ මුඛ්‍යාංගය මපනිධප, මපගු, රිමප ලෙස යෙදේ.
- ආසාවරී රාගය ජනක (ආශ්‍රය/ථාඨ) රාගයක් ලෙස හඳුන්වන අතර, ජෞනපුරි රාගය ජන්‍ය රාගයක් ලෙස හඳුන්වයි.
- රාග දෙකෙහි භාවයන් වෙනස් වේ.
- රාග දෙකෙහි යෙදෙන ඇතැම් රාග සංගතීන් එකිනෙක වෙනස් ආකාරයට භාවිත වේ.

(ඉහත ආකාරයට ඉදිරිපත්කොට ඇති ඕනෑම පිළිතුරු හතරක් පිළිගත හැකිය.)

www.alevelapi.com

<u>දේස් - තිලක්කාමෝද් අසමානතා</u>

- දේස් රාගය සම්පූර්ණ ජාති වන අතර, තිලක්කාමෝද් රාගය ෂාඩව - සම්පූර්ණ ජාති වේ.
- දේස් රාගයේ අවරෝහණයේ කෝමළ නිෂාදය යෙදෙන අතර, තිලක්කාමෝද් රාගයේ නිෂාද ස්වරය ශුද්ධව යෙදේ.
- දේස් රාගය මුඛ්‍යාංගය රිමප, නිධප, පධපම, ගරිගස වන අතර, තිලක්කාමෝද් රාගය මුඛ්‍යාංගය පනිසරිගස, රිපමග, සරිගසනි ලෙසින් යෙදේ.
- දේස් රාගයේ රිෂභ ස්වරයෙහි න්‍යාස වන අතර, තිලක්කාමෝද් රාගයේ නිෂාද ස්වරයෙහි න්‍යාස වේ.
- දේස් රාගය කෝමළ ගාන්ධාරය විවාදී ස්වරයක් ලෙස යොදා ගනී. (රි රිගු රිස) තිලක්කාමෝද් රාගයෙහි එසේ නොයෙදේ.
- දේස් රාගයේ අවරෝහණයෙහි රිෂභය වක්‍ර වේ. තිලක්කාමෝද් රාගයේ අවරෝහණයෙහි පංචමය වක්‍ර වේ.

  (ඉහත ආකාරයට ඉදිරිපත්කොට ඇති ඕනෑම පිළිතුරු හතරක් පිළිගත හැකිය.)

**2.** තුම්බාව සත්ත්ව හමකින් ආවරණය වී ඇති, හින්දුස්ථානි රාගධාරි සංගීතයෙහි යොදා ගැනෙන, තත් වාද්‍ය භාණ්ඩ හතරක තොරතුරු පහත වගුවේ දැක්වේ.

| **භාණ්ඩයේ නම** | **ප්‍රධාන තත් සංඛ්‍යාව** | **පර්දා සහිත/රහිත බව** | **වැයෙන උපකරණය** |
|---|---|---|---|
| .....A..... | 4 | පර්දා සහිතය | ගජ් (Bow) |
| .....B..... | 6 | පර්දා රහිතය | ජවා |
| .....C..... | 6 | පර්දා සහිතය | ගජ් |
| .....D..... | 4 | පර්දා රහිතය | ගජ් |

(i) ඉහත වගුවේ A, B, C සහ D හිස්තැන් සඳහා යෝග්‍ය වාද්‍ය භාණ්ඩ හතර හඳුනාගෙන, අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) ඉහත වගුවට අදාළ **එක්** සංගීත භාණ්ඩයක් පිළිබඳ ව පහත කරුණු ද ඇතුළත් වන සේ කෙටි විස්තරයක් ලියන්න.

● භාණ්ඩයේ හැඩය හා ආකෘතිය   ● වාදන ශෛලිය   ● ශාස්ත්‍රීය වාදන ශිල්පීන් (ලකුණු 04 යි.)

(iii)

| ග (ම) රි (underlined) ස | – ස (ම)ග ම | ප ධ (underlined) ස් (dot above) නි (underlined) | ධ (underlined, slur to ම) – ම ප |
|---|---|---|---|
| 0 | 3 | X | 2 |

(a) ඉහත සඳහන් ස්වර ප්‍රස්තාරය මිශ්‍ර රාගයකට අයත් වේ. එම ස්වර ප්‍රස්තාරයේ පූර්වාංගයෙන් පිළිබිඹු වන නිර්දේශිත රාගයේ නම සහ උත්තරාංගයෙන් පිළිබිඹු වන නිර්දේශිත රාගයේ නම ලියා, මුඛඩාවට අයත් ස්වර කොටස ද ලියා දක්වන්න. (ලකුණු 03 යි.)

(b) ඉහත ස්වර ප්‍රස්තාරයෙහි සංකේත සහිත ස්වර උත්පාදන විධි **තුනක්** උදාහරණ සහිතව නම් කරන්න. (ලකුණු 03 යි.)

(iv) ඒක් තාලයේ ඨේකාව නියමිත තාල සංකේත සහිතව ප්‍රස්තාර කර, ඉහත (iii) හි සඳහන් ස්වර රචනාව, ස්වර පිළිවෙළ **වෙනස් නොවන** අයුරෙන් ඒක්තාලයට අනුව ගළපා ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි.)

www.alevelapi.com

i වගුවෙහි A, B, C, D හිස්තැන් වලට අදාළ වාද්‍ය භාණ්ඩයන්හි නම් ලිවීමට - **ලකුණු 04**

ii අදාළ සංගීත භාණ්ඩ පිළිබඳ කෙටි විස්තරයක් ලිවීමට

- භාණ්ඩයේ හැඩය හා ආකෘතිය - ල. 02
- වාදන ශෛලිය - ල. 01
- ශාස්ත්‍රීය වාදන ශිල්පීන් - ල. 01

- **ලකුණු 04**

iii (a)

- ස්වර ප්‍රස්තාරයේ පූර්වාංගයෙන් පිළිඹිබු වන රාගයේ නම ලිවීමට - ල. 01
- උත්තරාංගයෙන් පිළිඹිබු වන රාගයේ නම ලිවීමට - ල. 01
- මුඛඩාවට අයත් වන ස්වර කොටස ලිවීමට - ල. 01

- **ලකුණු 03**

(b) ස්වර ප්‍රස්තාරයේ ස්වර උත්පාදන විධි උදාහරණ සහිතව නම් කිරීමට - **ලකුණු 03**

(උදාහරණ නොමැතිව නම් කර ඇති අවස්ථාවක එක් කරුණකට ලකුණු 001/2 බැගින් හිමිවේ.)

iv ඒක් තාලයේ යේකාව නියමිත තාල සංකේත සහිතව ප්‍රස්තාර කිරීමට

- යේකාවට - ල. 03
- තාල සංඥාවලට - ල. 01 } - **ලකුණු** 04

(යේකාවේ එක් විභාගයකට ලකුණු 001/2 බැගින් හිමිවේ.)

- iii හි සඳහන් ස්වර රචනාවේ ස්වර වෙනස් නොවන ආකාරයට ඒක් තාලයට ගලපා ලිවීමට - **ලකුණු** 02

**මුළු ලකුණු** 20 යි

i A - එස්රාජ්

B - සරෝද්

C - දිල්රුබා

D - සාරංගි

ii එස්රාජ්

| හැඩය හා ආකෘතිය | වාදන ශෛලිය | ශාස්ත්‍රීය වාදන ශිල්පීන් |
|---|---|---|
| • දළ වශයෙන් ඉලිප්සාකාර තුම්බාවකින් හා සිතාරයේ මෙන් දීර්ඝ කඳකින් යුක්තය.<br>• දාණ්ඩි හා තුම්බාව දැවයෙන් තනා ඇත.<br>• තුම්බාව සත්ව හමකින් ආවරණය වී ඇත.<br>• තුම්බාව හා දාණ්ඩි කොටස් දෙක එකිනෙක සම්බන්ධ කර ඇත.<br>• පර්දා සහිත ස්වර පුවරුවක් ඇත.<br>• අලුවකින් (Bow) වාදනය සිදුවේ.<br>• ප්‍රධාන තත් 4 ක් හා අනුනාද තත් 12-15 ත් අතර සංඛ්‍යාවකින් යුක්තය. | • ගායකී ශෛලියට වැයේ.<br>• ගත් වාදන ශෛලිය ද යොදා ගනී.<br>• ගායකී සහ ගත් වාදන ශෛලීන් දෙක මිශ්‍රව ද යොදා ගනී. | • අශීෂ් චන්ද්‍ර බෙනර්ජි<br>• රනාධීර් රෝයි<br>• සදානන්ද පට්ටිආරච්චි<br>• අනිල් මිහිරිපැන්න |

සරෝද්

| හැඩය හා ආකෘතිය | වාදන ශෛලිය | ශාස්ත්‍රීය වාදන ශිල්පීන් |
|---|---|---|
| • ගෝලාකාර තුම්බාවක් හා දීර්ඝ දණ්ඩි කොටසක් ද යතුරු පුවරුවකින් ද සමන්විතය.<br>• තුම්බාවට සත්ව හමක් යොදා ඇති අතර දණ්ඩියෙහි පර්දා රහිත රිදී ආලේපිත වානේ ස්වර පුවරුවක් සවිකර ඇත.<br>• ''ජවා'' නැමති උපකරණය භාවිතයෙන් වාදනය සිදුවේ.<br>• ප්‍රධාන තත් 6 ක් හා අනුනාද තත් ද යොදා තිබේ. | • ගත් වාදන ශෛලිය යොදා ගනී. | • උස්තාද් අලවුදීන් ඛාන්<br>• උ. අලි අක්බර් ඛාන්<br>• උ. අම්ජාඩ් අලි ඛාන්<br>• රත්න දිසානායක<br>• D.M. ගුණරත්න<br>• උපාලි ද සිල්වා |

දිල්රුබා

| හැඩය හා ආකෘතිය | වාදන ශෛලිය | ශාස්ත්‍රීය වාදන ශිල්පීන් |
|---|---|---|
| • දළ වශයෙන් සාරංගි භාණ්ඩයේ මෙන් චතුරශ්‍රාකාර වූ තුම්බාවකින් හා සිතාරයේ මෙන් දික් වූ දාණ්ඩි (කඳ) කොටසකින් යුක්තය.<br>• දුවයෙන් තනා ඇත.<br>• සාරංගියේ හා සිතාරයේ සම්මිශ්‍රනයකින් සැකසී තිබේ.<br>• තුම්බාවට හමක් අතුරා ඇති අතර සාරංගි භාණ්ඩයේ මෙන් චතුරශ්‍රාකාර වේ.<br>• සිතාරයේ මෙන් පර්දා සහිත ස්වර පුවරුවක් ඇත.<br>• අලුවකින් (Bow) වාදනය සිදුවේ.<br>• ප්‍රධාන තත් 6 ක් හා අනුනාද තත් 12-15 ත් අතර සංඛ්‍යාවකින් යුක්තය. | • ගායකී ශෛලියට වැයේ.<br>• ඇතැම් විට ගත් වාදන ශෛලිය ද යොදා ගනී. | • උස්තාද් රන්බීර් සිං<br>• උස්තාද් අමන්දීත් සිං<br>• ආචාර්ය නිශාද් හඳුන්පතිරණ |

සාරංගි

| හැඩය හා ආකෘතිය | වාදන ශෛලිය | ශාස්ත්‍රීය වාදන ශිල්පීන් |
|---|---|---|
| • එකම ලී කොටයකින් තැනූ චතුරශ්‍රාකාර තුම්බාවකින් සහ කෙටි පළල් වූ දාණ්ඩි කොටසකින් යුක්තය.<br>• උසින් අඩු භාණ්ඩයකි.<br>• තුම්බාව සත්ව හමකින් ආවරණය වී ඇත.<br>• වඳුරන්ගේ බඩවැල් හා මතස්‍ය බඩවැල් වේලා සකස් කරගත් තත් යොදා තිබේ.<br>• පර්දා රහිත ස්වර පුවරුවකි.<br>• අලුවකින් (Bow) වාදනය සිදුවේ.<br>• ප්‍රධාන තත් 4 ක් හා අනුනාද තත් රාශියකින් ද යුක්තය. | • ගායකී ශෛලියට වැයේ. | • පණ්ඩිත් රාමා නාරායන්<br>• උස්තාද් බුන්දු ඛාන්<br>• උස්තාද් සුල්තාන් ඛාන්<br>• උස්තාද් ශකීර් ඛාන්<br>• සදානන්ද පට්ටිආරච්චි |

iii (a) පූර්වාංගයෙන් පිළිඹිබු වන රාගය - භෛරව

උත්තරාංගයෙන් පිළිඹිබු වන රාගය - ආසාවරී

(b) මීන්ඩ් ධ - ම

මුර්කි (ම)

ඛන් ග[ම]

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .



iv

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| x | | 0 | | 2 | | 0 | | 3 | | 4 | |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
| ධිං | ධිං | ධාගෙ | තිරිකිට | තු | නා | කත් | තා | ධාගෙ | තිරිකිට | ධිං | නා |

ස්වර රචනාවේ සඳහන් ස්වර පිළිවෙල නොවෙනස් ව ඒක් තාලය අනුව ප්‍රස්තාර කර ඇති නිර්මාණයක් නිවැරදි ලෙස පිළිගත යුතුය.

**3.** (i) නිර්දේශිත සම්ප්‍රකෘති රාග ඇසුරෙන් පහත වගුවෙහි A සිට J තෙක් ඇති හිස්තැන් සඳහා ගැළපෙන පිළිතුරු අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග පිළිතුරු පත්‍රයේ ලියන්න. (ලකුණු 05 යි.)

| රාගය | ආවේණික සංගති කොටස | රාග ජාතිය |
|---|---|---|
| ......A...... | මගමරිස | ........B........ |
| ......C...... | මපධනිස් | ........D........ |
| ......E...... | ධපගමග | සම්පූර්ණ |
| ......F...... | ස්පධමග | ........G........ |
| ......H...... | පධස්නිධ | ........I........ |
| දේස් | මගරිගස | ........J........ |

(ii) වගුවෙහි සඳහන් සංගති කොටස් අනුව A සහ H අක්ෂරවලට අදාළ රාග දෙකෙන් කැමති **එක්** රාගයකට අයත් මධ්‍යලය ඛ්‍යාල් ගීතයක හෝ වාදිතයක හෝ අන්තරා කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (රාගයේ නම සඳහන් කරන්න.) (ලකුණු 04 යි.)

(iii) දීප්චන්දි තාලයේ ඨේකාව නියමිත තාල සංකේත සහිතව ප්‍රස්තාර කර, එක් ආවර්තයකට ගැළපෙන ලෙස ඉහත (ii) සඳහා ඔබ තෝරාගත් රාගයට අදාළව තිහායි සහිතව තානාලංකාරයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි.)

(iv) උත්තර භාරතීය සහ දක්ෂිණ භාරතීය සංගීත පද්ධති දෙකෙහි **අසමානතා** පහත සඳහන් කරුණු යටතේ ලියා දක්වන්න.

- සංගීත භාණ්ඩ
- තාල
- ගීත ආකෘතිය
- ස්වර විශේෂ
- ගායන ශෛලීන්

(ලකුණු 05 යි.)

www.alevelapi.com

i වගුවෙහි ඇතුළත් A සිට J දක්වා හිස්තැන්වලට ගැලපෙන නිවැරදි පිළිතුර ලිවීමට - **ලකුණු 05**

**(ලකුණු 001/2 බැගින් හිමිවේ.)**

ii A හා H යන රාග දෙකෙන් කැමති එක් රාගයකට අදාළ මධ්‍යලය ඛ්‍යාල් හෝ වාදිතයක අන්තරා කොටස ප්‍රස්තාර කිරීමට - **ලකුණු 04**

- ස්වර ප්‍රස්තාරයට පාද දෙකක් ප්‍රමාණවත්ය
- එක විභාගයකට ලකුණු 001/2 බැගින් හිමිවේ.

iii දීප්චන්දි තාලයේ ඨේකාව නියමිත තාල සංකේත සමග ප්‍රස්තාර කිරීමට

- ඨේකාව නිවැරදිව ලිවීමට - ල. 02
- තාල සංකේත වලට - ල. 01

- ලකුණු 03

ඔබ තෝරාගත් රාගයට අදාළව තිහායි සහිතව තානාලංකාරයක් ලිවීමට - **ලකුණු 06**

- තානාලංකාරයට (තිහායි ලියා නැතිනම්) - ල. 02
- තානාලංකාරයට (තිහායි සහිතව ලිවීමට) - ල. 03

- ලකුණු 03

iv දී ඇති කරුණු යටතේ උත්තර භාරතීය සහ දක්ෂිණ භාරතීය පද්ධති දෙකෙහි අසමානතා ලිවීමට
**- ලකුණු 05**

**(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු පහට ලකුණු 05 ක් හිමිවේ.)**
**මුළු ලකුණු 20 යි.**

i A - භෛරව රාගය B - සම්පූර්ණ

C - ජෞනපුරි රාගය D - ෂාඩව - සම්පූර්ණ

E - කාලිංගඩා රාගය G - ෂාඩව - සම්පූර්ණ

F - තිලක්කාමෝද් රාගය I - ඖඩව - සම්පූර්ණ

H - ආසාවරී රාගය J - සම්පූර්ණ

ii භෛරව හෝ ආසාවරී හෝ එක් රාගයකට අදාළව මධ්‍යලය ඛ්‍යාල් ගීතයක හෝ වාදිතයක හෝ අන්තරා කොටස

(රාගයේ නම ද සහිතව) ස්වර ප්‍රස්තාර කර තිබිය යුතුය.

www.alevelapi.com

iii දීප්චන්දි තාලය

| x | 2 | 0 | 3 |
|---|---|---|---|
| 1 2 3 | 4 5 6 7 | 8 9 10 | 11 12 13 14 |
| ධා ධිං - | ධා ධා ධිං - | තා තිං - | ධා ධා ධිං - |
| ධා ධිං - | ධා ධා ධිං - | ධා තිං - | තා ධා ධිං - |
| ධා ධිං - | ධා ධා තිං - | තා තිං - | ධා ධා ධිං - |

iv උත්තර භාරතීය හා දක්ෂිණ භාරතීය සංගීත පද්ධති දෙකෙහි අසමානතා

- **සංගීත භාණ්ඩ**

උත්තර භාරතීය සංගීත පද්ධතියෙහි තබ්ලා, සිතාර් වැනි භාණ්ඩ භාවිත වන අතර දක්ෂිණ භාරතීය සංගීත පද්ධතියෙහි මෘදංගම්, වීණා වැනි භාණ්ඩ භාවිත වේ. (මේ ආකාරයේ අදහස් දැක්වෙන අයුරින් විවිධ උදාහරණ සහිතව ලියන පිළිතුරු අදාළ කර ගැනේ.)

- **තාල**

උත්තර භාරතීය තාල ලෙස ත්‍රිතාල්, ජප් තාල්, දීප්චන්දි ආදිය භාවිත වන අතර දක්ෂිණ භාරතීය මූලික තාල හතක් ඒක, ත්‍රිපුට, ඣම්ප, මත්‍ය ආදී වශයෙන් ද හඳුන්වයි. එම තාල, ජාති පහකින් ගුණ වී තාල 35 වශයෙන් ද ගති වශයෙන් ගුණ වී තාල 175 ක් වශයෙන් ද ප්‍රායෝගිකව භාවිත වේ.

- **ගීත ආකෘතිය**

උත්තර භාරතීය සංගීතයේ ස්ථායි, අන්තරා, සංචාරී, අභෝග වශයෙන් ගීත ආකෘතිය ගොඩනැගී ඇති අතර දක්ෂිණ භාරතීය සංගීතයේ පල්ලවී, අනුපල්ලවී, චරණම්, චිට්ටාස්වරම්, වශයෙන් ගීත ආකෘතිය ගොඩනැගී ඇත.

- **ස්වර විශේෂ**

උත්තර භාරතීය සංගීතයේ ස්වර දොළහකින් යුක්ත වන අතර, දක්ෂිණ භාරතීය සංගීතයේ එම ස්වර, නාම දහසයකින් හඳුන්වයි.

- **ගායන ශෛලීන්**

උත්තර භාරතීය සංගීතයේ ධ්‍රැපද්, ධමාර්, ඛ්‍යාල්, ගසල්, භජන්, තරාණා, චතුරංග ආදී ගායන ශෛලීන් භාවිත වන ඇති අතර දක්ෂිණ භාරතීය සංගීතයේ වර්ණම්, තිල්ලානා, පදම්, කීර්තනම් ආදී වශයෙන් භාවිත වේ.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .



## II කොටස

**4.** පහත වගුවෙහි ඇතුළත් තොරතුරු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| A | B |
|---|---|
| • ආඝාතාත්මකව ගැයේ. | • අනාඝාතාත්මකව ගැයේ. |
| • සේ ගී විශේෂයක් වේ. | • මෙහෙ ගී විශේෂයක් වේ. |
| • සත්ත්වයකු සිද්ධියක් හෝ පුද්ගලයකු පිළිබඳ වර්ණනා ඇතුළත් වේ. | • පරිසර වර්ණනා සහ වෘත්තීය ස්වභාවය, ගීත තුළින් පිළිබිඹු වේ. |
| • මහනුවර යුගයේ දී විකාශය සිදු විය. | • ඉහළ ශ්‍රැතියකින් ආරම්භ වී හඬ පහළට විහිදී පළමු ගී පාදයේ අවසානය දෙවැනි ගී පාදයේ ආරම්භය සමග ගායනයේ දී සම්බන්ධ වීම සිදු වේ. |

(i) **A** හා **B** කොටස්වල ඇතුළත් තොරතුරු හා සම්බන්ධ ගීත විශේෂ නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) **A** කොටසේ දැක්වෙන ගී වර්ගයට අදාළ (වගුවේ සඳහන් **නොවන**) ලක්ෂණ **හතරක්** ලියන්න. (ලකුණු 04 යි.)

(iii) **B** කොටසේ ඇතුළත් ගී විශේෂයේ සාරධර්ම හා සෞන්දර්යාත්මක අගයන් ඉස්මතු වන ආකාරය, පද්‍ය පාද උදාහරණයට ගනිමින් පැහැදිලි කරන්න. (කරුණු **තුනක්** ප්‍රමාණවත් වේ.) (ලකුණු 06 යි.)

(iv) සුළු මහ දෙතිතට ගැයෙන නිර්දේශිත වන්නමක තානම සහ කවියක් පද ප්‍රස්තාර කර, එම තාලරූපයේ විශේෂත්වය පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

i A හා B කොටස් වලට සම්බන්ධ ගීත විශේෂයන් නම් කිරීමට - **ලකුණු** 02

ii A කොටසේ ඇතුළත් ගී වර්ගයේ ලක්ෂණ හතරක් ලිවීමට - **ලකුණු** 04

(වගුවේ සඳහන් නොවන තොරතුරු තිබිය යුතුයි.)

iii B කොටසේ ඇතලත් ගී විශේෂය පිළිබඳව සාරධර්ම හා සෞන්දර්ය අගයන් යටතේ

පද්‍ය පාද තුනක් උදාහරණයට ගනිමින් ලිවීමට - **ලකුණු** 06

- උදාහරණ සහිතව කරුණු තුන ලිවීමට - ල. 06
- උදාහරණ රහිතව කරුණු තුන ලිවීමට - ල. 03

iv සුළු මහ දෙතිතට ගැයෙන වන්නමේ තානම හා කවියක් ප්‍රස්තාර කිරීමට

- තානම පාද තුනක් වශයෙන් ගෙන එක් පාදයකට - ල. 03
- කවිය පාද තුනක් වශයෙන් ගෙන එක් පාදයකට - ල. 03
- තිත් සංඥාවලට - ල. 01
- තාල රූපයේ විශේෂත්වය පැහැදිලි කිරීමට - ල. 01

} - **ලකුණු** 08

**මුළු ලකුණු** 20 යි

i A - උඩරට වන්නම්

B - බඹර කැපීමේ ගී

ii උඩරට වන්නම්

- ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු සමයේ උඩරට වන්නම් නිර්මාණය වීම.
- දක්ෂිණ භාරතීය සංගීතයේ ආභාෂය ලැබීම.
- ''ගණිතාලංකාර'' නම් දක්ෂිණ භාරතීය සංගීතඥයාගේ දායකත්වය ලැබීම.
- මහනුවර ''කවිකාර මඩුව'' ආශ්‍රයෙන් ගොඩ නැගීම.
- ''ගැටබෙරය'' ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වීම.
- තානම, කවිය, කස්තිරම, සීරුමාරුව හා අඩව්ව යනුවෙන් කොටස් පහකින් යුක්ත වීම.
- උඩරට වන්නම් දහ අටක් භාවිතයේ පැවතීම.
- දේශීය තිත් ක්‍රමය මත උඩරට වන්නම් ගොඩ නැගීම.
- විවිධ තිත් රූප මත නිර්මාණය වීම.
- සරල මෙන්ම සංකීර්ණ නාද රටා (සුරපති වන්නම) දක්නට ලැබීම.

iii පිළිතුරෙහි <u>සාරධර්ම සහ සෞන්දර්යාත්මක අගයන් ඉස්මතු වන අවස්ථා පිළිඹිබු වන, කවි පාද උදාහරණයට ගනිමින් පැහැදිලි කර තිබිය යුතුය.</u>

❖ කළගුණ සැලකීමේ ගුණය මනා ලෙස පිළිඹිබු වන අයුරු
  - බඹරු තොපට පිං අත්වෙයි කියන්නා
  - බඹරිදුනේ තොපහට මම පිං දෙන්දෑ
  - බඹර කපා පැණි හැමටම බෙදන්නා

❖ සානුකම්පිත බව පෙන්වීම
  - යන්නම් බඹරු දුක් මැසිවිලි කියාලා
  - අපේ දුකට කැඩුවයි බඹර රාගලේ
  - දෙවියනි වරද නැත නාඩන් බඹර මලේ
  - අම්මපල්ල බඹරුන් අත වරද නැතී

❖ අන්‍යෝන්‍ය සහයෝගය, එකමුතු බව, විශ්වාසය තිබුණු බව සනාථ වීම
  - කැපුවේ බඹරු අපි තුන්දෙන බරතු ගලේ
  - එකසිය බඹර කැපුමට දෙන්නාම යමු

❖ සතුනට හිංසා පීඩා කිරීම විශාල අකුසලයක් බව සඳහන් වීම
  - බඹර කපන අය නරකාදියේ යතී

<u>ස්වභාව සෞන්දර්ය ඉස්මතු වන ආකාරය පිළිඹිබු වීම</u>

- බැද්ද වටට සුදු මොර මල් පිපීලා
- බැද්ද හැම තැනම මොර මල් සුදු එළියා
- බැද්ද වටට මොර මල් වාසනාවේ
- මදුගම හෙලේ බලතොත් මෙමෙ වරෙල්ලා

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .



iv තානම

| ^ | / | ^ | / |
|---|---|---|---|
| ත ම් | ත ම් දෙ න | තා S | නා S S ම් |
| ද න | ත ම් දෙ න | තා S | නා S S ම් |
| ත ම් | ත ම් දෙ න | තා S | නා S තෙ යි |
| ත ම් | ද S S S | S S | S S S S |
| S S | නා S ත ම් | දෙ S | නා S S S |
| නාS S | S S S S | S S | S S S S |

කවිය

| ^ | / | ^ | / |
|---|---|---|---|
| සු රි | දු න් පෙ ර | සි S | ට S S න් |
| බ ල | යු ත් සැ ව | ති S | දු S S න් |
| ස හ | ගො ස් ක ළ | යු S | දෙ S S න් |
| අ S | සූ S S S | S S | S S S S |
| S S | ර න් ජ ය | නො S | ල S S S |
| දින් S | S S S S | S S | S S S S |

- මාත්‍රා 2+4 වශයෙන් ගොඩ නැගෙන තාලයක් හින්දුස්ථානි සංගීත පද්ධතියෙහි නොතිබීම විශේෂ ලක්ෂණයයි.

**5.** “ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායන්හි උන්නතිය උදෙසා විවිධ සංගීත ක්‍රම මෙන් ම දේශීය සංගීත ලක්ෂණ ද බලපා ඇත”

(i) නූර්ති රංග ශෛලිය සඳහා හින්දුස්ථානී සංගීතයෙහි ආභාසය ලැබී ඇති ආකාරය නිදසුන් සහිත ව කරුණු **හතරක්** යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

(ii) නාඩගම් රංග ශෛලිය සඳහා කර්ණාටක සංගීතයෙහි ආභාසය ලැබී ඇති ආකාරය කරුණු **හතරක්** යටතේ නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

(iii) කෝලම් හා සොකරි රංග සම්ප්‍රදායන්හි රංග ලක්ෂණ **දෙකක්** හා සංගීත ලක්ෂණ **දෙකක්** පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 04 යි.)

(05) i නූර්ති සඳහා හින්දුස්ථානි සංගීතයේ ආභාසය ලැබී ඇති ආකාරය නිදසුන් සමග ලිවීමට

**- ලකුණු** 08

- නිදසුන් සහිතව කරුණු හතරක් ලිවීමට - ල. 2x4 = 08
- නිදසුන් රහිතව කරුණු හතරක් ලිවීමට - ල. 1x4 = 04

ii නාඩගම් සඳහා කර්ණාටක සංගීතයේ ආභාසය ලැබී ඇති ආකාරය නිදසුන් සමග ලිවීමට

**- ලකුණු** 08

- නිදසුන් සහිතව කරුණු හතරක් ලිවීමට - ල. 2x4 = 08
- නිදසුන් රහිතව කරුණු හතරක් ලිවීමට - ල. 1x4 = 04

iii

- කෝලම් සහ සොකරි රංග සම්ප්‍රදායන් දෙකෙහි රංග ලක්ෂණ දෙකක් සංසන්දනාත්මකව ලිවීමට - ල. 02
- කෝලම් සහ සොකරි රංග සම්ප්‍රදායන් දෙකෙහි සංගීතමය ලක්ෂණ දෙකක් සංසන්දනාත්මකව ලිවීමට - ල. 02

} **ලකුණු 04**

**මුළු ලකුණු 20 යි**

(05) i නූර්ති රංග ශෛලිය සඳහා හින්දුස්ථානි සංගීතයෙහි ආභාසය

- විශ්වනාත් ලව්ජි, ජටා ශංකර්, සතා ශිවම්, අබ්දුල් අගීස් වැනි ඉන්දියානු සංගීතඥයින්ගේ සේවය ලබා ගැනීම.
- සර්පිනා, තබ්ලා, වයලින් වැනි සංගීත භාණ්ඩ යොදා ගැනීම
- ජිංජුටි, ජොනපුරි, භෛරවී, පීළු, දේස්, කාෆි වැනි රාග ආශ්‍රයෙන් තනු නිර්මාණය වී තිබීම
- කෙහෙර්වා, දීප්චන්දි, දාදරා වැනි හින්දුස්ථානි තාල යොදා ගැනීම.
- ස්ථායි - අන්තරා, ආකෘතිය මත ගීත ප්‍රබන්ධ වීම.
- ඛ්‍යාල් ගායන ශෛලීය ලක්ෂණ පිළිඹිබු වීම.
- දොහොරා, තානාලංකාර ආදී කොටස් භාවිත ව තිබීම.

උදා - ''වාසනා දිනේකි මේක'' යන ගීතයේ ''කෝමල මධුර බසිනී.....''

''සෝබමාන දේව පුරා'' යන ගීතයේ නිස රිග රිස නිධ පම ගරි ස

ii <u>නාඩගම් රංග ශෛලිය සඳහා කර්ණාටක සංගීතයේ ආභාසය</u>

- ''තෙරික්කුත්තු'' වීදි නාට්‍ය ආභාසය ලබා තිබීම.
- හරිකාම්බෝජි, කරහරප්‍රිය, හනුමන්තෝඩි වැනි කර්ණාටක රාග මත තනු නිර්මාණය කිරීම.
- තානම, උරුට්ටුව, ඉන්නිසය, තෝඩායම වැනි අංග ඇතුළත් වීම.
- පසන්, තිර්ලානා, වඩිමෝඩි ආදී තාල භාවිත කිරීම.
- අලගනායිදු නම් සංගීතඥයාගේ දායකත්වය ලැබීම.

iii <u>කෝලම් - සොකරි රංග ලක්ෂණ සංසන්දනය</u>

- කෝලම් සඳහා වෙස් මුහුණු පළඳින අතර සොකරි සඳහා කොළපත් මුහුණු පැළඳීම.
- වෙස් මුහුණු භාවිතය හේතුවෙන් සොකරි රංග ශෛලියට වඩා කෝලම් නාට්‍ය සම්ප්‍රදායෙහි සංකීර්ණ බවක් මෙන්ම අලංකාර බවක් ද පෙන්නුම් කරයි.
- කෝලම් සඳහා රංග භූමිය ලෙස තානායම්පොල යොදා ගන්නා අතර සොකරි සඳහා කමත යොදා ගනියි.
- කෝලම් - සොකරි සම්ප්‍රදායන් දෙකෙහිම පිරිමින් පමණක් රංගනයේ යෙදේ.
- කෝලම් සඳහා පහතරට ශාන්තිකර්ම ද, සොකරි සඳහා උඩරට ශාන්තිකර්ම ද ආභාස කරගෙන ඇත.
- සමාජයේ විවිධ චරිතයන් හි දුර්වලතා හාස්‍යයෙන්, උපහාසයෙන් ඉදිරිපත් කිරීම කෝලම් හි ලක්ෂණයක් වන අතර සොකරි නාට්‍යයන් හි ඇතැම් චරිත හාස්‍ය ජනක වේ.


- අනුරූපණ මාධ්‍යයෙන් කතාව ගොඩ නැගීම සොකරි නාට්‍යයන් හි සිදුවන නමුත් එවැනි විශේෂත්වයක් කෝලම්හි පෙන්නුම් නොකෙරේ.
- සශ්‍රීකත්වය හා කෘෂිකර්මාන්තය ආශ්‍රිතව සොකරි නාට්‍ය රඟ දක්වන අතර, සමාජයේ විවිධ සිදුවීම්, අවස්ථා සහ දුර්වලතා පෙන්වා දීම කෝලම් නාට්‍යයේ අරමුණකි.

කෝලම් - සොකරි සංගීතමය ලක්ෂණ

- රංග ශෛලීන් දෙකෙහිම ගායනා පටු ස්වර පරාසයකින් යුක්ත වීම.
- සම්ප්‍රදායන් දෙකෙහිම ඒකාකාරී තනු දක්නට ලැබීම.
- නාට්‍ය සම්ප්‍රදායන් දෙකම කවි ආකෘතිය මත නිර්මාණය වීම.
- කෝලම්හි ආඝාතාත්මක හා අනාඝාතාත්මක ගායනා යෙදෙන අතර, සොකරි නාට්‍යයන්හි ආඝාතාත්මක හා ගද්‍ය සංවාද ද යොදා ගැනීම.
- කෝලම් සඳහා ගීත තනු රටා සඳහා පහතරට ශාන්තිකර්ම ආභාසය ද, සොකරි ගී තනු උඩරට ශාන්ති කර්ම ආභාසය ද ලබා තිබීම.
- කෝලම් නාට්‍ය සඳහා පහතරට බෙරයත්, සොකරි සඳහා ගැටබෙරය හා උඩැක්කියත්, තාල වාද්‍ය භාණ්ඩ ලෙස යොදා ගැනීම.
- විවිධ ගමන් තාල හා බෙර පද නාට්‍ය දෙකෙහිම යොදා තිබීම.

**III කොටස**

6.



(i) (a) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය අයත් ස්කේලය (Scale) නම් කරන්න. (ලකුණු 01 යි.)

(b) එම ස්කේලයට අයත් ස්වර පිළිවෙළින් ලියන්න. (ලකුණු 02 යි.)

(ii) ඉහත දැක්වෙන අපරදිග ස්වර ප්‍රස්තාරයේ ටයිම් සිග්නේචරයට (Time Signature) ගැළපෙන හින්දුස්ථානි තාලය නම් කර, යේකාව ප්‍රස්තාර කරන්න. (ලකුණු 03 යි.)

(iii) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරන්න. (ලකුණු 08 යි.)

(iv) පහත සඳහන් පාරිභාෂික වචන අතුරෙන් **දෙකක්** තෝරාගෙන නිදසුන් දක්වමින් විස්තර කරන්න.

(a) ස්ලර් (Slur) (b) පිසිකාටෝ (Pizzicato)

(c) ස්ටෙකාටෝ (Staccato) (d) ලෙගාටෝ (Legato) (ලකුණු 06 යි.)

(06)

i (a) අපරදිග ස්වර ප්‍රස්තාරය අයත් ස්කේලය නම් කිරීමට - **ලකුණු** 01

(b) ස්කේලයට අයත් ස්වර පිළිවෙලින් ලිවීමට - **ලකුණු** 02

ii ටයිම් සිග්නේචරයට ගැලපෙන හින්දුස්ථානි තාලය නම් කර ඨේකාව ප්‍රස්තාර කිරීමට

- තාලය නම් කිරීමට - ල. 01
- ඨේකාව ප්‍රස්තාර කිරීමට - ල. 02 } - **ලකුණු** 03

iii පෙරදිග ක්‍රමයට ස්වර ප්‍රස්තාර කිරීමට - **ලකුණු** 08

(එක් විභාගයකට ලකුණු 001/2 බැගින් හිමිවේ.)

iv පාරිභාෂික වචන වලින් දෙකක් තෝරා ගෙන නිදසුන් සමග විස්තර කිරීම - ල. 03x2-
නිදසුන් රහිතව විස්තර කිරීමට - ල. 02x2 } **ලකුණු** 06

**මුළු ලකුණු 20 යි**

i (a) C minor / C Natural minor

(b) ස රි ග ම ප ධ නි ස - C D $E^b$ F G $A^b$ $B^b$ C

ii දාදරා තාලය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| තාලසංඥා | x | | | 0 | | |
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| ඨේකාව | ධා | ධි | නා | ධා | තු | නා |

iii


| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ම | ගරි | සරි | සනි | + | ස | රි | ග | ම | ගරි | රිග | මග | රිග |
| | රිස | ස | - | + | පප | ධප | ම | ගරි | රි | + | මම | ගරි |
| | ගරි | ස | ස | + | නිනි | ස | රි | ස | නි | සරි | ගම | ගරි |
| | රිග | මග | රිග | රිස | ස | - | - | - | - | - | - | ම |

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .


iv (a) ස්ලර් - මෙම සංකේතය යොදා ඇති තැන් හි සඳහන් ස්වර කිහිපය එකිනෙක සම්බන්ධතාවය පවත්වා

ගැනීමෙන් සහ, මෘදුව වාදනය කිරීමෙන් උත්පාදනය සිදුවේ. ස්ලර් සංකේතය ලෙගාටෝ සංකල්පය හා බැඳී පවතී.

උදා -




Alevel

(b) පිසිකාටෝ - මෙම සංකේතය යොදා ඇති ස්ථානයෙහි දක්වෙන ස්වරය හෝ ස්වර කිහිපය වයලීන වාදනයේ දී අලුව (Bow) අතේ රඳවා ගනිමින්, අතේ දබරැගිල්ල තත මත ස්පර්ශ කරමින් වැයීම සිදුවේ

උදා -




www.alevelapi.com

(c) ස්ටෙකාටෝ - මෙම සංකේතය දක්වෙන ස්වරය හෝ ස්වර කිහිපය හඬ කෙටියෙන් උත්පාදනය කර වාදනය සිදුවේ. (ස්වර විරාම සහිතව වැයිම.)

උදා -



(d) ලෙගාටෝ - මෙම ශිල්ප ක්‍රමය සඳහා භාවිත වන සංකේතය වන්නේස්ලර් යන්නයි. ඒ සඳහා legato යන වචනය ලිවීම ද සිදුවේ. මෙහි දී සිදුවන්නේ හඬ නොකඩවා පවතින අයුරින් උත්පාදනය කිරීමයි.

උදා- 1 අළුවෙන් (Bow)වයන භාණ්ඩ වාදනයේ දී එක් පහරකින් (Bow strock)ස්වර කිහිපය උත්පාදනය කිරීම.

2 සුෂිර වාද්‍ය භාණ්ඩ වාදනයේ දී එක් සුළං පහරකින් (In one blow)හඬ උත්පාදනය කිරීම.

**7.** "බෝ පත් අගින් දිලෙන සඳරැසින් නැහැ වූ
පින් බිමේ සෑ රදුන් බැතින් නමදින් හදින්"

(i) ඉහත දැක්වෙන ගී පාද ගැළපෙන තාලයකට අනුව පද ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

(ii) එම පද ප්‍රස්තාරය සඳහා සුදුසු තනුවක් නිර්දේශිත රාගයක් ඇසුරෙන් නිර්මාණය කර, ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 08 යි.)

(iii) ඔබ නිර්මාණය කළ තනුවට ගැළපෙන කෝඩ්ස් (Chords) ගීත ස්වර ප්‍රස්තාරයෙහි සඳහන් කරන්න. (ලකුණු 08 යි.)

(07)

i ගී පාදයට ගැලපෙන තාලයකට අනුව පද ප්‍රස්තාර කිරීමට - **ලකුණු** 04

(පද පේලි හතරක් ලෙස සලකා එක් පාදයකට ලකුණු 01 බැගින්)

ii නිර්දේශිත රාගයක් ඇසුරින් සුදුසු තනුවක් නිර්මාණය කර ගීත ස්වර ප්‍රස්තාර කිරීමට - **ලකුණු** 08

(පද පේලි හතරක් ලෙස සලකා අදාළ තනුවේ එක් පද පේලියකට ලකුණු 02x4 වශයෙන් ලකුණු හිමිවේ.)

(ගුණාත්මක බවින් හා නිර්මාණාත්මක බවින් යුත් තනුවක් නිර්මාණය කර තිබිය යුතුය.)

iii තනුවට ගැලපෙන කෝඩ්ස් ලිවීමට - **ලකුණු** 08

(විභාග 16 ක් ලෙස සලකා එක් විභාගයකට ලකුණු 001/2 බැගිනි.)

**මුළු ලකුණු** 20 යි

i දෙන ලද ගී පාදය ගැලපෙන තාලයකට අනුව නිවැරදිව පද ප්‍රස්තාර කර තිබිය යුතුයි.

ii පද ප්‍රස්තාරයට අනුව සුදුසු තනුවක් නිර්දේශිත රාගයක් ඇසුරින් ගුණාත්මක හා නිර්මාණාත්මක බවින් යුතුව

නිර්මාණය කර ගීත ස්වර ප්‍රස්තාර කර තිබිය යුතුයි.

iii නිර්මාණය කළ තනුවට ගැලපෙන ලෙස කෝඩ්ස් ( Chords ) යොදා තිබිය යුතුයි.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .



**8.** (i) (a) අපරදිග සංගීතයේ හඬතල **හතර** නම් කරන්න. (ලකුණු 02 යි.)

(b) එම හඬතල හතර සඳහා ගැළපෙන අපරදිග සංගීත භාණ්ඩ **දෙක** බැගින් පෙළගස්වන්න.(ලකුණු 04 යි.)

(c) "ජොහාන් සෙබෙස්තියන් බාක්" සංගීතඥයා විසින් සිදු කළ සංගීත නිර්මාණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) පහත මාතෘකා අතුරෙන් **දෙකක්** පිළිබඳ ව උදාහරණ සහිතව කෙටියෙන් විස්තර කරන්න.

(a) කණ සහ ස්වරාලය සංගීතයේ දී වැදගත්වන අයුරු

(b) මුල් යුගයේ දේශීය චිත්‍රපට සඳහා ලද දකුණු ඉන්දීය ආභාසය

(c) මනස සුවපත් කිරීමෙහි ලා සංගීත චිකිත්සාව (ලකුණු 06 × 2 = 12 යි.)

(08) i (a) අපරදිග සංගීතයේ හඬ තල හතර නම් කිරීමට - **ලකුණු** 02

(b) හඬ තල හතර සඳහා ගැලපෙන අපරදිග සංගීත භාණ්ඩ දෙක බැගින් ලිවීමට - **ලකුණු** 04

(c) ජොහාන් සෙබස්තියන් බාක් සංගීතඥයාගේ සංගීත නිර්මාණ දෙකක් නම් කිරීමට - **ලකුණු** 02

ii (a) කණ හා ස්වරාලය සංගීතයේ දී වැදගත්වන ආකාරය උදාහරණ සහිතව විස්තර කිරීමට

- කණ පිළිබඳ උදාහරණ සමග විස්තර කිරීමට - ල. 03
- උදාහරණ නොමැති ව විස්තර කිරීමට - ල. 02
- ස්වරාලය පිළිබඳ උදාහරණ සමග විස්තර කිරීමට - ල. 03
- උදාහරණ නොමැති ව විස්තර කිරීමට - ල. 02

(b) මුල් යුගයේ දේශීය චිත්‍රපට සඳහා ලද දකුණු ඉන්දියානු ආභාසය උදාහරණ සහිතව විස්තර කිරීමට - **ලකුණු** 06 x 2 - **ලකුණු** 12

- උදාහරණ සමග විස්තර කිරීමට - ල. 06
- උදාහරණ නොමැති ව විස්තර කිරීමට - ල. 04

(c) මනස සුවපත් කිරීමෙහි ලා සංගීත චිකිත්සාවපිළිබඳව උදාහරණ සමග විස්තර කිරීමට

- උදාහරණ සමග විස්තර කිරීමට - ල. 06
- උදාහරණ නොමැති ව විස්තර කිරීමට - ල. 04

**මුළු ලකුණු** 20 යි

i (a) Soprano - සොප්රානෝ

Alto - ඇල්ටො

Tenor - ටෙනර්

Bass - බේස්

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .



(b) Soprano - පිකලෝ, වයලින්, ට්‍රම්පට්, ක්ලැරිනට්, කොන්සට් ෆ්ලූට්, සැක්සෆෝන්

Alto - වියොලා, සැක්සෆෝන්, ෆ්‍රෙන්ච් හෝන්, ඕබෝ

Tenor - චෙලෝ, සැක්සෆෝන්, ටියුබා

Bass - ඩබල් බේස්, බැරිටෝන්, ටියුබා, ඊයුෆෝනියම්, බේස් ෆ්ලූට්

(c)

- Trio sonatas (Bwv 1036 - 1040)
- Sonatas for flute and keyboard instruments
- Six sonatas for hapsichord and violin
- Mass in B minor
- Ave Maria

ii (a)

- කර්ණේන්ද්‍රියේ නිවැරදි සංවේදීතාවය මෙන්ම ස්වරාලය හැසිරවීමේ කුසලතාවය සංගීතයේදී වැදගත් වේ.
- සංගීත නිර්මාණ වින්දනය මෙන්ම ප්‍රකාශනය සඳහා කර්ණේන්ද්‍රිය වැදගත් වේ.
- ගායනය සහ වාදනය දෙකටම පොදු ඉන්ද්‍රිය වන්නේ කර්ණේන්ද්‍රියයි.
- නාද, තාල භාවිතය සඳහා කණ මනාසේ පුහුණු කළ යුතුවේ.
- කර්ණේන්ද්‍රියේ සංවේදීතාවය සංගීත විෂය හා බැඳී පවතී.
- නිවැරදි ස්වර ස්ථාන ග්‍රහණය කර ගැනීමට කර්ණේන්ද්‍රියේ යෝග්‍යතාවය ප්‍රයෝජනවත් වේ.
- නිවැරදි ශ්‍රවණය තුලින් සුවිශේෂී සංගීතාංග හඳුනා ගැනීමත්, ස්වරාලයේ නිවැරදි හැසිරවීම තුලින් මිහිරි ලෙස ගායන ඉදිරිපත් කිරීමත් සිදුකළ හැකිවේ.
- ශ්‍රවණය මගින් ග්‍රහණය කරගත් නාද ස්ථාන නිවැරදිව ගායනය සඳහා ස්වරාලය වැදගත් වේ.
- උච්ච, මන්ද්‍ර, තීව්‍ර, කෝමළ ආදී විවිධ ස්වර ස්ථාන උත්පාදනයට ස්වරාලය නිවැරදිව හැසිරවීමේ හැකියාව ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.
- ස්වරාලය නිවැරදිව පුහුණු කිරීමෙන් විවිධ හඬ තල අනුව ගායනයේ යෙදීමට හැකිවේ.
- ස්වරාලයේ සිහින් බව හා මහත් බව, සිහින් කට හඬක් හා ගැඹුරු කට හඬක් සඳහා බලපායි.

(b)

- 1947 න් ඇරඹි ශ්‍රී ලාංකික චිත්‍රපට කර්මාන්තය දකුණු ඉන්දීය චිත්‍රපට කලාව මුල් කර ගෙන පෝෂණය වීම.
- ඉන්දීය චිත්‍රපට නිෂ්පාදකයින්, සංගීතඥයින්, වාදකයින්, ගායක ගායිකාවන් හා ඉන්දීය චිත්‍රාගාර පසුබිම් කර ගෙන චිත්‍රපටි නිෂ්පාදනය කිරීම.
- මුල් යුගයේ දේශීය චිත්‍රපට සඳහා දායක වූ දමිළ චිත්‍රපට අධ්‍යක්ෂකවරු හා චිත්‍රපට

  - J. සිංහ - කඩවුණු පොරොන්දුව
  - K. සුබ්‍රමනියම් - කපටි ආරක්ෂකයා
  - T. R. සුන්දරම් - සුජාතා, අහංකාර ස්ත්‍රිය
  - A.S. නායගම් - මාතලන්
- ඉන්දීය ගායක ගායාකාවන්
  - ජමුනා රාණි
  - K. රාණි
  - M. රාජා
  - ලතා මංගේෂ්කර්
- ද්‍රවිඩ චිත්‍රපටවල ඍජු අනුවාද
  - වේලක්කාරමගල් හා පරශක්ති - අහංකාර ස්ත්‍රීය
  - මරු මගල් සහ ගුමස්නා - පුදුම ලේළි
- ද්‍රවිඩ සංගීත අධ්‍යක්ෂකවරු හා චිත්‍රපට
  - R. නාරායන් අයියර් - කඩවුණු පොරොන්දුව
  - S. දක්ෂිණ මූර්ති - සුජාතා, සැඩ සුළං
  - T. R. පාපා - සුරගනී, සුරතලී
- ද්‍රවිඩ ගීත අනුකරණයෙන් නිර්මාණය වූ සිංහල ගීත
  - සන්ධ්‍යාවෙ ශ්‍රීය රම්‍යා ලෙස පේනා - පර්දේශි බාලා

(c)

- සතුට ජනිත කරවන සංගීතය මනසේ සංවේදීතාව ඉහළ නංවයි.
- මවගේ මිහිරි ගායනාවන්ට සවන් දීම, මව්කුසේ සිටින දරුවාගේ මොළය වර්ධනයට හේතුවේ.
- සංගීතය මනස අවදි කරයි. ස්නායු වර්ධනයට හේතුවේ.
- සංගීතයේ රිද්මීය ලක්ෂණ සහ නාදමය ස්වරූප මනස විවිධ අයුරින් සුවපත් කරලීමට මෙන්ම උත්තේජනය වීමටද හේතුවේ.
- වෛද්‍ය පර්යේෂණයන්ට අනුව සුභාවිත සංගීතයට සවන් දීමෙන්
  - රුධිර පීඩනය පහළ දැමීම.
  - විෂාදය අවම කිරීම. (මානසික අවපීඩනය)
  - මානසික ප්‍රබෝධය වර්ධනයවීම
  - නිර්මාණශීලී හැකියා ඉහළ නැංවීම.
  - ආතතිය, සාංකාව අඩු කරලීම.
  - ධනාත්මක සිතුවිලි ඇතිකරලීම.
  - මානසික සංහිඳියාව ඇතිකරලීම
  - සෞන්දර්යාත්මක සිතුවිලි හැඟීම් පහලවීම
  - ආකල්පමය (ආවේදනික ක්ෂේත්‍රය) වශයෙන් යහපත් වීම
  - මනස නිරවුල් කරලීම, ආදී ඵල ලැබේ.